# 2 ඉන්දියාවේ ඓතිහාසික වර්ධනය

**ඉන්දියාවේ ඓතිහාසික වර්ධනය පිළිබඳ ඉගෙනීමේ දී ආර්ය ජනාවාස, සොළොස් මහා ජනපද, මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තියට දායක වූ රජවරුන්, ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය හා එහි සංස්කෘතික කාර්ය සංසිද්ධීන් පිළිබඳ තොරතුරු හඳුනාගැනීම සඳහා මෙම ඒකකය අධ්‍යයනය කරමු.**

## ඉන්දියාවේ ආර්ය ජනාවාස

ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ඉන්දියාව පිළිබඳ වැදගත් ඓතිහාසික සිදුවීම වන්නේ ආර්යයන්ගේ පැමිණීම ය. මෙම ජනකොටස් ක්‍රි.පූ. 1500ට ආසන්න කාලයක දී ඉන්දියාවට පැමිණ ජනාවාස පිහිටුවා ගත් බව පොදු පිළිගැනීමයි.

ආර්යයන්ගේ මුල් බිම පිළිබඳ ව ඉතිහාසඥයෝ විවිධ මත පළ කරති. බොහෝ දෙනාගේ අදහස අනුව ආර්යයන්ගේ මුල් බිම මධ්‍ය ආසියාවේ පිහිටි ස්ටෙප්ස් තණබිම් ප්‍රදේශයයි. මෙහි සිටි ජනකොටස්වලින් එක් කොටසක් යුරෝපය දෙසටත්. තවත් කොටසක් ඉන්දියාව දෙසටත් ඉරානය දෙසටත් සංක්‍රමණය වූහ. මධ්‍ය ආසියාවේ සිට ඛයිබර් දුර්ගය ඔස්සේ ඉන්දියාවට පැමිණි ආර්යයන් ඉන්දියාවේ මුලින් ම පදිංචි වූයේ සින්ධු නදී පද්ධතිය ආශ්‍රිත ව පිහිටි වර්තමාන පංජාබ් ප්‍රදේශයේ ය. පංජාබ් යනු ගංගා පහේ රට යන්නයි. මුල දී එම ප්‍රදේශයේ ගංගා හතක් තිබූ නිසා සප්ත සින්ධු ප්‍රදේශය නම් විය.



ආර්ය සංක්‍රමණය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍රය වශයෙන් වැදගත් වන්නේ වේද ග්‍රන්ථ (ඍග්, යජුර්, සාම, අථර්වන්) බ්‍රාහ්මණ, උපනිෂද්, පුරාණ වැනි ග්‍රන්ථ සහ මහා භාරතය වැනි වීර කාව්‍යය ය. ආර්යයන් ඉන්දියාවට පැමිණ පදිංචි වූ මුල් යුගය ඍග් වෛදික යුගය ලෙස ද ඉන්දියාවේ ව්‍යාප්ත වූ පසු අවදිය පශ්චාත් වෛදික යුගය ලෙස ද හඳුන්වනු ලැබේ.

ඍග් වේදයට අනුව ආර්යයන් මුලින් ම පංජාබ් ප්‍රදේශයේ පදිංචි වී පසු ව ඇතැම් කණ්ඩායම් ගංගා යමුනා නදී ප්‍රදේශයේ බටහිරට (වර්තමාන දිල්ලිය ආශ්‍රිත ප්‍රදේශවලට) පැතිර ගිය බව පෙනී යයි. ඔවුහු ක්‍රි.පූ. 7 සියවස වන විට ගංගා යමුනා තැනිතලා ඔස්සේ උතුරු ඉන්දියාව පුරා ම ජනාවාස පිහිටුවා ගත්හ. ඇතැම් කණ්ඩායම් වින්ධ්‍යා කඳුවැටිය තරණය කොට ඩෙකෑන් සානු ප්‍රදේශයේ පදිංචි විය. ක්‍රි.පූ. 6වන සහ 5වන සියවස පමණ වන විට සමහර ආර්ය කණ්ඩායම් දකුණු ඉන්දියාවට ද ශ්‍රී ලංකාවට ද පැමිණ ජනාවාස පිහිටුවා ගෙන ඇත.

ඉන්දියාවේ ආර්ය ජනාවාස පිහිටුවීමේ දී දේශීය ජන කොටස් සමග ඇතැම් විට ගැටුම් ඇති වූ අවස්ථා ද දක්නට ලැබිණ. මෙසේ ජනාවාස පිහිටුවා ගත් ආර්යයන්ගේ පාලන සංවිධානය, ආර්ථික රටාව, සමාජ සංවිධානය, ආගම හා දර්ශනය පිළිබඳ තොරතුරු සොයා බලමු.

## පාලන සංවිධානය

- ගෝත්‍ර වශයෙන් සංවිධානය වීම.
- සප්ත සින්ධු ප්‍රදේශයේ ම ගම්මාන බිහිවීම .
- කුඩාම පරිපාලන ඒකකය ගම වීම.
- ග්‍රාමණී හෙවත් ගමණී නමින් ගමේ නායකයා හැඳින්වීම.
- ගම් කිහිපයක් එකතු වී රාජ්‍ය බිහි වීම. එහි නායකයා "රාජන්" නමින් හැඳින්වීම.

- ✪ රාජ්‍ය නිලධාරීන් අතර පුරෝහිත සේනානි වැනි තනතුරු තිබීම.
- ✪ ගම් වැසියන් ගෙවිය යුතු බදු එකතු කිරීම ග්‍රාමණීට පැවරුණු කාර්යයක් වීම.
- ✪ පාලන කටයුතු පහසුව සඳහා පසු ව "සභා" හා "සමිති" යන සංවිධාන බිහිවීම.
- ✪ නගර පාලනය සඳහා නගර ප්‍රධානියෙක් වීම.
- ✪ නගර පාලනය සඳහා එක් මණ්ඩලයකට පස් දෙනා බැගින් මණ්ඩල 6ක් හෝ 7ක් පැවතීම.

## ආගම හා දර්ශනය

- ✪ දෙවියන් ඇදහීම දක්නට ලැබීම.
- ✪ සියලු ම වෛදික දෙවිවරු ස්වභාව ධර්මයේ බලවේග නියෝජනය කළ දෙවිවරු වීම. (ඉන්ද්‍ර, පෘථිවි, වරුණ, අග්නි යම ආදී දෙවිවරු) අග්නි ගින්නට අධිපති ලෙස ද, වරුණ වැස්සට හා සරුසාර බවට අධිපති ලෙස ද පිළිගැනීම.
- ✪ බ්‍රාහ්මණ සංකල්පය වර්ධනය වීම.
- ✪ උග්‍ර තපස්දම් ආරක්ෂා කිරීමෙන් සත්‍ය සොයා ගිය මුනිවරුන් පසු කාලයේ එනම් පශ්චාත් වෛදික යුගයේ දක්නට ලැබීම.
- ✪ සත්‍ය ගවේෂණය, බුදු දහම හා ජෛන ආගම බිහිවීමට හේතු වීම.

## ආර්ථික රටාව

### කෘෂිකර්මය

- ✪ ගම්වල ජීවත් වූ මුල් ආර්යයෝ එඬේර ජීවිතයට මහත් ලැදියාවක් දක්වීම.
- ✪ එළදෙන ආර්යයන්ගේ පාරිශුද්ධ වස්තුවක් වශයෙන් පිළිගැනීම.
- ✪ මුල් ආර්යයෝ ස්ථිර ජනාවාස පිහිටුවා ගැනීමෙන් පසු කෘෂිකර්මයට වඩාත් නැඹුරු වීම.

### කර්මාන්ත

- ✪ සේද රෙදි හා කපු රෙදි නිෂ්පාදනය කිරීම.
- ✪ රෙදි සායම් කිරීම හා විසිතුරු මැහුම් පිළිබඳ දැන සිටීම.
- ✪ ගෙවල් හා ගෘහ භාණ්ඩ තැනීමට දැන සිටීම.
- ✪ යකඩ භාවිත කර ගොවි උපකරණ හා කඩුව, හෙල්ල වැනි උපකරණ සෑදීම.

### වෘත්තීන්

- ✪ ගොවීන්, රන්කරුවන්, කුඹල්කරුවන්, වෙළඳුන්, පූජකවරුන්, වෛද්‍යවරුන්

### වෙළඳාම

- ✪ ගොඩබිම් මාර්ග හා ගංගා ඔස්සේ වෙළෙඳාම සිදුවීම.
- ✪ භාණ්ඩ ප්‍රවාහනයට කරත්ත හා බෝට්ටු යොදා ගැනීම.
- ✪ වෙළඳාම භාණ්ඩ හුවමාරුව මත සිදු වීම.
- ✪ දුර බැහැර රටවල් සමග ද වෙළෙඳාම සිදුවීම.


## සමාජය

- ✪ පවුල ප්‍රධාන සමාජ ඒකකය වීම.
- ✪ පීතෘ මූලික සමාජයක් වීම.
- ✪ ආර්ය හා අනාර්ය වශයෙන් ජන කොටස් දෙකක් දක්නට ලැබීම. අනාර්ය යනු ආර්යයන් නොවූ පිරිසක් වීම.
- ✪ පශ්චාත් වෛදික යුගයේ වර්ණ භේදය ද ඇති වීම. ප්‍රධාන වර්ණ 4ක් වීම. (බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර)
- ✪ ආහාර පාන යටතේ මස්, කිරි, ගිතෙල්, වෙඬරු මුදවාපු කිරි, එළවළු, සහල්, බාර්ලි, තල ආදිය යොදගත් අතර පැලැටි සාරයන්ගෙන් සකස් කළ "සෝම පානය" ඉතා ජනප්‍රිය වීම.
- ✪ කපු, ලොම් හා හම් යොදා සකස්කරගත් ඇඳුම් භාවිතය.
- ✪ ගැහැනු පිරිමි දෙපක්ෂය විසින් ම ආභරණ පැලඳීම.
- ✪ නාට්‍ය, වීණාවාදන, සංගීත වැනි සෞන්දර්ය අංශ ද දියුණුවීම.
- ✪ මල්ලවපොර, දඳු වැනි ක්‍රීඩා පැවතීම.

## සොළොස් මහා ජනපද

උතුරු ඉන්දියාවේ ආර්ය ජනාවාස ව්‍යාප්ත වීමත් සමග කුඩා රාජ්‍ය බිහි විය. ක්‍රි.පූ. 6වන සියවස පමණ වන විට ඉන් 16ක් නැගී ඒම දක්නට ලැබිණ. මෙසේ නැගී ආ රාජ්‍ය සොළොස් මහා ජනපද ලෙස හඳුන්වන ලදී. අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේදි, වත්ස, මත්ස්‍ය, පංචාල. කුරු, සූරසේන. අස්මක, අවන්ති. ගන්ධාර හා කාම්බෝජ එම රාජ්‍ය දහසය යි.

මෙම රාජ්‍යවල පාලන තන්ත්‍ර එකකින් එකකට වෙනස් විය. උදාහරණ වශයෙන් ඇතැම් රාජ්‍යයන්ගෙන් ගණ, සංඝ හෙවත් සමූහාණ්ඩු පාලනයක් පැවතුණි. මෙම ජනපද දහසයෙන් මගධය, කෝසල, වත්ස හා අවන්ති යන රාජ්‍යයන්ට දේශපාලන ක්ෂේත්‍රයේ වැදගත් තැනක් ගෙන තිබිණ. වජ්ජි හා මල්ල යනුවෙන් ගණ රාජ්‍ය දෙකක් ද විය. මේවායේ ප්‍රභූ පන්තියේ ආධිපත්‍යයක් දක්නට විය. වජ්ජි, මල්ල රාජ්‍යවලට වයඹ දිගින් කෝසල රාජ්‍යය ද දකුණින් හා ගිණිකොණ දිගින් මගධ රාජ්‍යය ද පිහිටියේ ය. ප්‍රබල ම රාජාණ්ඩු වූ කෝසල හා මගධ යන රාජ්‍ය දෙකෙන් වඩාත් ප්‍රබල රාජ්‍ය ලෙස මගධය නැගී ඒම පසු කලක සිදු විය.




**සිතියම 2.1 - සොළොස් මහා ජනපද**

**ක්‍රියාකාරකම්**
**ඉන්දියාවේ සිතියමක සොළොස් මහා ජනපද ලකුණු කර නම් කරන්න.**

## මගධ රාජ්‍යයේ නැගීම

අනෙක් රාජාණ්ඩු අභිභවා මගධය ඉදිරියට ගෙන ඒමට උත්සාහ කළ ප්‍රථම පාලකයා බිම්බිසාර රජතුමා ය. ඔහු අනුගමනය කළ විවාහ සම්බන්ධතා නිසා සිය බලය විවිධ ප්‍රදේශවල තහවුරු කිරීමට හැකි විය. කෝසල රජුගේ සොහොයුරිය ආවාහ කර ගැනීමෙන් ඉතා වටිනා කාසි රාජ්‍යය බිම්බිසාර රජතුමාට ලැබීම නිදසුනක් ලෙස දැක්විය හැකි විය.

බිම්බිසාර රජතුමා සටන්කාමී ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් මගධ රාජ්‍යයට ප්‍රදේශ ඈඳා ගැනීම ද දක්නට ලැබිණ. බ්‍රහ්මදත්ත රජු සමග සටන් කොට අංග රාජ්‍යයේ බලය අල්ලා ගැනීම එයට නිදසුනකි.

බිම්බිසාර රජතුමා බුදුන්වහන්සේගේ මෙන් ම ජෛන මහාවීරතුමාගේ ද අනුග්‍රාහකයෙක් වීය. මගධය විවිධ ආගමික නිකායන්ට විවෘත ප්‍රදේශයක් වීය. මෙසේ ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ද මගධයේ නැගීමට බලපා ඇත.


මගධයේ අගනුවර රජගහනුවර විය. බිම්බිසාර රජතුමාගෙන් පසු ඔහු පුත් අජාසත් රජ වී ය. ඉන්පසු පාටලීපුත්‍ර නගරයට (පැට්නා) අගනුවර මාරු විණ. ලිච්ඡවීන් ඇතුළු සියලු ගණ රාජ්‍යවල බලයත්, කෝසල රාජ්‍යයත් ඇතුළු රාජ්‍ය ගණනාවක් මගධයට යටත් කර ගැනීමට අජාසත් රජතුමාට හැකි වී ය.

උතුරු ඉන්දියාවේ ප්‍රබල රාජ්‍යයක් වූ මගධය තවදුරටත් ව්‍යාප්ත වූයේ නන්ද රාජවංශය යටතේ ය. මෙහි ආරම්භක පාලකයා වූයේ මහා පද්ම නන්ද රජතුමාය. නන්ද පරපුරේ අවසාන වැදගත් පාලකයා වූ ධනනන්ද රජතුමාගේ කාලයේ උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත වූ රාජ්‍යයක් බවට මගධ අධිරාජ්‍ය පත් වී ය.

ග්‍රීක ජාතික මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයා පංජාබය ඇතුළු වයඹ දිග ඉන්දියාව ආක්‍රමණය කළ ද ගංගා යමුනා තැනිතලාව ආක්‍රමණය කළ නොහැකි වූයේ මගධ අධිරාජ්‍යය ප්‍රබල වූ නිසා යැයි විශ්වාස කරනු ලැබේ. ඒ සමග ම වාගේ මගධයේ බලය මෞර්ය රාජ වංශයට හිමි වූ අතර එහි ප්‍රථම පාලකයා චන්ද්‍ර ගුප්ත මෞර්ය රජතුමා වීය.

**ක්‍රියාකාරකම**

**මගධ අධිරාජ්‍යයේ ව්‍යාප්තිය දැක්වෙන සිතියමක් අඳින්න. මගධ අධිරාජ්‍යයට යටත් වූ රාජ්‍ය නම් කරන්න.**




**සිතියම 2.2 - මගධ අධිරාජ්‍යය**

# මෞර්ය අධිරාජ්‍යය

උතුරු ඉන්දියාවේ බලයට පත් වූ මෞර්ය රාජ වංශයේ ආරම්භක පාලකයා චන්ද්‍රගුප්ත මෞර්ය (ක්‍රි.පූ. 324-300 දක්වා) රජතුමා ය. ඔහු පුත් බින්දුසාර හා බින්දුසාරගේ පුත් අශෝක රජතුමා යටතේ මෞර්ය අධිරාජ්‍ය ව්‍යාප්ත විය.

රාජ්‍යත්වයට පත් වී නොබෝ කලකින් ඉන්දියාවේ වයඹදිග ප්‍රදේශ විදේශ ආධිපත්‍යයෙන් මුදවා ගැනීමට චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමා ඉදිරිපත් විය. ඔහු ඉන්දු නදියෙන් බටහිර වූ වයඹදිග ඉන්දියානු ප්‍රදේශ ජය ගැනීම සඳහා සෙලියුකස් නිකේටර් සමග කළ සටනින් ජය ගත්තේ ය. වයඹ දෙසින් පර්සියානු අධිරාජ්‍ය දක්වාත්, උතුරින් හිමාලය දක්වාත්, දකුණින් ක්‍රිෂ්ණ, තුංගභද්‍ර ගංගා ආශ්‍රිත ප්‍රදේශය දක්වාත්, මෞර්ය අධිරාජ්‍ය ව්‍යාප්ත වූ බව සෙල්ලිපි අනුව පැහැදිලි වේ. විශාල අධිරාජ්‍යයක් ගොඩනගා ගත් චන්ද්‍රගුප්ත රජු එය පාලනය කිරීම සඳහා කාර්යක්ෂම පරිපාලන සංවිධානයක් ද ඇති කළේ ය.

චන්ද්‍රගුප්ත මෞර්යට පසු ව බලයට පත්වන්නේ ඔහු පුත් බින්දුසාර (ක්‍රි.පූ. 300 - 273 දක්වා) රජතුමා ය. තම පියාගේ කාලයේ පැවති විශාල අධිරාජ්‍යය ඒ අයුරින්ම පවත්වා ගෙන යාමට බින්දුසාර රජතුමාට හැකි විය.

බින්දුසාර රජතුමාගෙන් පසු මෞර්ය අධිරාජ්‍යයේ බලයට පත් වූයේ අශෝක (ක්‍රි.පූ. 273 - 236) රජතුමා ය. සෙල්ලිපිවල මෙම රජතුමා හඳුන්වන්නේ "දේවානම්පිය පියදසි" යනුවෙනි.

අශෝක රජතුමා සිය රාජ්‍ය කාලය ආරම්භයේ දී රණකාමී චණ්ඩ ජීවිතයක් ගත කරමින් සිය අධිරාජ්‍ය ව්‍යාප්ත කිරීමට උත්සුක වීය. අශෝක රජතුමා ගැන අධ්‍යයනය කිරීමේ දී බෞද්ධ හා ජෛන සූත්‍ර මෙන් ම අශෝක සෙල්ලිපි ද වැදගත් වේ. මේ කාලයේ දී නැගෙනහිර ඩෙකෑනයේ පිහිටි කාලිංග දේශය යටත් කර ගැනීමට ඔහු දරුණු සටනක් මෙහෙය විය. මගධයේ පාලකයා බවට පත් වී 13වන රාජ්‍ය වර්ෂයේ ඇති වූ මෙම කාලිංග යුද්ධය එතුමාගේ පෞද්ගලික ජීවිතයේ මෙන්ම පාලන තන්ත්‍රයේ ද වෙනස්කම් ඇති කිරීමට හේතු වූ බව පිළිගැනේ.

# අශෝක අධිරාජ්‍යය


අශෝක රජු දවස මෞර්ය අධිරාජ්‍යය විශාල ප්‍රදේශයක පැතිරී ගියේ ය. මුලින් තිබු අධිරාජ්‍යයට කාලිංගය එකතුවීම, අශෝක අධිරාජයාගේ සමයේ දී සිදු විය. එතුමාගේ ගිරිලිපි පිහිටා ඇති ස්ථාන අනුව අශෝක අධිරජ්‍යයේ සීමාත්, සෙල්ලිපි පිහිටා ඇති ස්ථාන අනුව ස්වාධීන රාජ්‍ය පැවති ප්‍රදේශත්, ටැම් ලිපි අනුව රජු චාරිකාවේ යෙදුන ස්ථානත් හඳුනාගත හැකිය. මේ අනුව බලනවිට කාවේරි නදියෙන් දකුණේ සුළු භූමි ප්‍රමාණයක් හැරුණ විට ඉතිරි සියලු ම ප්‍රදේශ, අශෝක රජුට යටත් ව පැවතිණ. මෙම අධිරාජ්‍යයේ අගනුවර වූයේ පාටලීපුත්‍ර නගරයයි. කාලිංග යුද්ධයෙන් බලවත් චිත්ත සන්තාපයට පත් අශෝක රජතුමා බුද්ධාගම වැළඳගත් බව පිළිගැනේ. මින් පසු මොහු සිය දිග් විජය ප්‍රතිපත්තිය අවසන් කොට ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කළ බව සෙල්ලිපි හා ටැම් ලිපිවල සඳහන් වේ. විනෝද චාරිකා වෙනුවට ධර්ම යාත්‍රාවන්හි නියැලිණි. ඇමතිවරුන් " ධර්ම මහා මාත්‍ර " තනතුරුවලට පත් කරන ලදී.

**"මගෙන් ඇති වන කිසි දරු කෙනෙක්, මුණුබුරු කෙනෙක් හෝ වෙත් ද, ඔහු තවත් අලුත් දිග් විජයක් නො පතත්වා. ඉඳින් ඔවුනට විජයග්‍රහණයක් වුවමනා නම් ඉවසීමෙන් ලුහුඬු දඬුවමෙහිත් යෙදෙත්වා. ධර්ම විජය සැබෑ විජය ම සේ සලකත්වා"**

**13 වන ගිරි ලිපිය**

**"සියලු රටවැසියෝ මාගේ දරුවෝය. ඔවුන්ගේ සුභ සෙත සැලසීම මගේ පරම යුතුකම ය"**

යන්න අශෝක ශිලාලිපිවල සඳහන් වී තිබීමෙන් පෙනී යන්නේ අශෝක රජතුමා ධාර්මික හා සාමකාමී පාලනයක් ගෙන ගිය බව ය.



සිතියම 2.3 - අශෝක අධිරාජ්‍යය

## ධර්මාශෝක රජතුමාගේ කාර්යයන්

- මහා මාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම.
- විශ්‍රාම ශාලා, ළිං, පොකුණු සෑදවීම.
- සෙවණ සඳහා මඟ දෙපස ගස් සිටුවීම.
- මිනිසුන් මෙන් ම තිරිසන් සතුන් සඳහා ද රෝහල් ඉදිකිරීම.
- ධර්ම මහාමාත්‍ර නම් නිලධාරීන් පත් කිරීම.
- චෝළ දේශය, පාණ්ඩ්‍ය දේශය, තම්බපණ්ණි, සිරියාව හා මිසරය ආදී රටවල් සමග කුළුපග සම්බන්ධතා පැවැත්වීම.
- තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීම.
- සාංචි ස්තූපය ඇතුළු ස්තූප රාශියක් කරවීම.
- බ්‍රාහ්මණ, ආජීවක, ජෛන වැනි ආගම් කෙරෙහි හා ඒවායේ පූජ්‍ය පක්ෂයට ගරු සරු දැක්වීම හා අනුග්‍රහය දැක්වීම.
- ධර්ම දූතයන් වහන්සේලා රටවල් 09කට පිටත්කර හැරීම.

## මෞර්ය පාලනයේ ලක්ෂණ



රූපය 2.2 - සාංචි ස්තූපය

- රජතුමා පාලනයේ ප්‍රධානියා වී ය.
- ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ හා යුද හමුද යන අංශවල පූර්ණ බලතල රජුට පැවරිණි. මෙය මධ්‍යම සංකේන්ද්‍රගත පාලනයක් තිබූ බවට උදහරණයකි.
- පාලනයේ දී රජුට උපදෙස් දීමට හා සහාය වීමට මන්ත්‍රී මණ්ඩලයක් වී ය.
- රජුට සහාය වීමට නිලධාරී පිරිසක් ද වී ය.
- යුවරජු, පුරෝහිත, මන්ත්‍රී, සේනාපති, අධ්‍යක්ෂවරුන්, යුක්ත (අයබදු එකතු කළ අය), ලිපිකරුවන් දූත පිරිස් ආදීන් ඒ අතර වැදගත් විය.
- පළාත් පාලනය : පළාත් පාලනය රජ පවුලේ කුමාරවරුන් හෝ අමාත්‍යවරුන් විසින් සිදු කෙරිණි. ප්‍රත්‍යන්ත රාජ්‍ය රාෂ්ට්‍ර, (දිස්ත්‍රික්ක වශයෙන් ද) රාෂ්ට්‍ර නැවත ගම් දහස, ගම් සියය, ගම් හතළිහ, ගම් විස්ස ලෙස බෙදු තිබිණ. පාලන බලතල විකේන්ද්‍රණය කොට තිබූ බව ඉන් පැහැදිලි වේ.
- කර්මාන්ත, විදේශ කටයුතු, උපත් හා මරණ, නිෂ්පාදන කටයුතු, ආදායම් හා වෙළඳ කටයුතු එම මණ්ඩල හය වෙත පැවරිණි.
- අධිකරණ කටයුතු රජුට පැවරී තිබුණත් ඒවා පවත්වා ගෙන යාමේ බලය විවිධ තරාතිරමේ නිලධාරීන්ට පැවරිණි. ගම් මට්ටමේ සිට රජු දක්වා අධිකරණ බලය විමධ්‍යගත ව පැවතුණි.

## මෞර්ය යුගයේ සංස්කෘතිය

### ආගම

- හින්දු, බෞද්ධ, ජෛන, ආදී ආගම් පැවතුන අතර ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත.
- අශෝක රජතුමාගේ කාලයේ තුන්වෙනි ධර්ම සංගායනාව පැවැත්වීම වැදගත් ආගමික කටයුත්තකි.
- ඉන්දියාව තුළ මෙන්ම විදේශ රටවල ද ධර්මය ප්‍රචාරය කර ඇත.

**නිදසුන් :** **කාශ්මීර, ගන්ධාර, මහිසමණ්ඩල, වනවාස, අපරන්තක, මහාරාෂ්ට්‍ර, ස්වර්ණ භූමි, ලංකාද්වීපය, යෝනක රට (ග්‍රීක ජනපද)**

## භාෂාව හා සාහිත්‍යය

- ප්‍රාකෘත, මාගධී හා සංස්කෘත යන භාෂා ව්‍යාප්ත වී ය.
- සංස්කෘත හා ප්‍රාකෘත භාෂාවලින් සාහිත්‍ය පොත් ලියා ඇත. බ්‍රාහ්මණ ග්‍රන්ථ,
- මෞර්ය රාජ සභාවේ මාගධී භාෂාව භාවිතයට ගැනිණි.



රූපය 2.3 අශෝක ස්ථම්භය

## ගෘහ නිර්මාණ හා කලා ශිල්ප

- ස්තූප ඉදිකිරීම (අශෝක රජතුමා සුවාසූදහසක් වෙහෙර විහාර ඉදිකළ බව මූලාශ්‍රවල සඳහන් වේ) සාංචි ස්තූපය එක් නිදසුනකි.
- ලෙන් ඉදිකිරීම කර ඇත. (බරාබර් කඳු පාමුල ඇති ලෙන්)
- අශෝක ස්ථම්භ (අශෝක රජුගේ අණපනත් හා ධර්මානුශාසනා පිළිබඳ සඳහන් කර ඇති සාරනාත්, රුම්මින්දේයි වැනි ස්ථානවල පිහිටි කුළුණු මීට නිදසුන් ය).

## කැටයම් කලාව

- ගව, සිංහ, ඇත්, ආදී සත්ත්ව රූප අශෝක ටැම්වල මුදුනේ නෙළා තිබීම
- ලෞරිය නන්දනගර්, සාරනාත් ස්තම්භවල සිංහ මූර්ති අලංකාරය සඳහා නිමවා ඇත.

### ක්‍රියාකාරකම්

✍ මෞර්ය අධිරාජ්‍යය පිළිබඳ පහත සඳහන් කරුණු යටතේ තොරතුරු ගොනුවක් සකස් කරන්න. අදාළ ස්ථානවල සිතියම් හා පින්තූර ද ඇතුළත් කරන්න.

මෞර්ය යුගයේ වැදගත් රජවරු, අධිරාජ්‍ය දක්වා ව්‍යාප්ත වූ අන්දම, පරිපාලන කටයුතු, ආගමික කටයුතු, භාෂා සාහිත්‍ය, ගෘහ නිර්මාණ, කැටයම් කලාව හා කලාශිල්ප.

## අශෝක රජතුමාගෙන් පසු ඉන්දියාව

අශෝක රජතුමාගෙන් පසු මෞර්ය අධිරාජ්‍යය ක්‍රමයෙන් පරිහානියට පත් විය. එයට බලපෑ හේතු කිහිපයකි.

- වයඹදිගින් පැමිණි විදේශ ආක්‍රමණ
- ප්‍රාදේශීය පාලකයන් බලවත් වීම
- අශෝක රජුට පසු ව පැමිණි පාලකයන් අතර විශාල අධිරාජ්‍යයක් පාලනය කළ හැකි පාලකයකු නොවීම.
- යුද්ධ නිසා විශාල ආර්ථික පරිහානියක් සිදුවීම.
- රාජසභාවේ පැවති අභ්‍යන්තර ගැටුම

මෞර්ය අධිරාජ්‍ය බිඳවැටීමෙන් පසු ව විවිධ විදේශීය පාලකයන් ඉන්දියාවේ සමහර ප්‍රදේශවල බලය අත්පත් කරගත් අතර වයඹ දිග ඉන්දියාව මුල්කරගෙන කුෂාණවරු බලයට පත් වූහ. ඔවුහු චීන ප්‍රදේශවල සිට වයඹ දිග ඉන්දීය ප්‍රදේශවලට පැමිණි යු-ඒ-චි ගෝත්‍රයට අයත් වූහ. මෙම රජ පවුලේ වැදගත් ම පාලකයා වූයේ කණිෂ්ක රජු ය. (ක්‍රි.ව. පළමුවන සියවසේ) මෙම රජතුමා මහායාන බුද්ධාගමේ ප්‍රධාන අනුග්‍රාහකයෙක් වී ය. හතර වන ධර්ම සංගායනාව පැවැත්වීමේ දී මූලිකත්වය ගන්නා ලද්දේ කණිෂ්ක රජතුමා ය. බුදු පිළිම නෙළීම ද පළමුවෙන් ඇරඹුණේ මේ රජතුමාගේ කාලයේ යයි පිළිගැනේ.

## ගුප්ත අධිරාජ්‍යය

ගුප්ත යුගයේ ආරම්භකයා ලෙස පළමු වැනි චන්ද්‍රගුප්ත රජු හඳුන්වනු ලැබේ. කුමාර දේවී නමින් හැඳින්වූ ලිච්ඡවී කුමාරිකාවක් සරණ පාවා ගැනීමෙන් පසු විශාල ප්‍රදේශයක මහා රාජාධිරාජ ලෙස පළමු වැනි චන්ද්‍රගුප්ත රජු අභිෂේක ලැබී ය.

මින් පසු පළමුවෙනි චන්ද්‍රගුප්ත රජුගේ පුත් සමුද්‍ර ගුප්ත රජ වීය. (ක්‍රි.ව. 320-380) ඔහුගේ අධිරාජ්‍ය ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනයේ දී වැදගත් වන ප්‍රධානතම මූලාශ්‍රය අලහබාද් ප්‍රශස්තියයි. එය අශෝක අධිරාජයාගේ අලහබාද් ස්තම්භයේ ප්‍රතිමුඛයේ කොටා ඇත.

සමුද්‍රගුප්ත රජුගේ පාලන ප්‍රදේශ මධ්‍ය ප්‍රදේශයෙහි නැගෙනහිර හා දකුණු ප්‍රදේශ ඔස්සේ ඔරිස්සා තෙක් හා ඉන් අනතුරු ව නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය ඔස්සේ පල්ලව රාජ්‍ය තෙක් ද ව්‍යාප්ත වූ අතර ඔහු උතුරු හා වයඹ ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් ද සිය අධිරාජ්‍යයට එක් කළේ ය.

සමුද්‍රගුප්ත රජු කවියෙක් මෙන් ම සංගීතඥයෙක් ද විය. බ්‍රාහ්මණ ආගමිකයෙකු වූ මොහු බ්‍රාහ්මණයන්ට ගව දෙනුන් පූජා කළේ ය. අශ්ව මේධ යාගය පැවැත් වී ය. සමුද්‍රගුප්ත අධිරාජයා විසින් නිකුත් කර ඇති කාසි ඔහුගේ බලය, දේශපාලන ආධිපත්‍ය හා ආර්ථික සමෘද්ධිය විදහා දක්වයි. ගුප්ත යුගයේ සිටි ඉතා ප්‍රබල ශක්තිමත් පාලකයෙකු ලෙස සමුද්‍ර ගුප්ත රජු පිළිගැනීමට ලක් වී ඇත.




**සිතියම 2.4- ගුප්ත අධිරාජ්‍යය**

මේ රජතුමා ප්‍රත්‍යන්ත ප්‍රදේශවල සිටි අවමුක්තයේ නීලරාජ, වෙන්ගියේ හස්තිවර්මන්, කාංචියේ විෂ්ණුගෝප වැනි රජවරුන් ද පරාජය කර ඇති බව මූලාශ්‍රයවලින් සනාථ වේ. සමුද්‍රගුප්ත රජුගෙන් පසු ඔහු පුත් දෙවැනි චන්ද්‍රගුප්ත රජවීය. ගුප්ත අධිරාජ්‍යයේ ප්‍රබල ව්‍යාප්තියක් ඇති වූයේ මේ රජුගේ කාලයේ දී ය. චන්ද්‍රගුප්ත අධිරාජයා බටහිර ඉන්දියාවේ ශක ශත්‍රප බලය බිඳ දැමීම නිසා දේශපාලන වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් ද වර්ධනයක් සිදු විය. මේ නිසා බෙංගාල බොක්කේ සිට අරාබි මුහුද දක්වා වරායන් පාලනය කිරීමට ගුප්ත අධිරාජ්‍යයට අවස්ථාව ලැබිණ. කලාව, ගෘහ නිර්මාණ ශිල්පය හා සාහිත්‍ය යන ක්ෂේත්‍රවලට පුළුල් අනුග්‍රහයක් දැක්වූ මොහුගේ රාජ සභාවේ නවරත්න නම් උගතුන් විසූ බව ද සඳහන් වේ.

හින්දුකුෂ් කඳුකරයෙන් ඔබ්බට සිය සටන් මෙහෙයවා වාහ්ලිකයන් පරාජය කළ නිසා ඉන්දියාවෙන් බැහැරට අධිරාජ්‍ය ව්‍යාප්ත කිරීමට දෙවැනි චන්ද්‍රගුප්ත රජුට හැකි විය. ඔහු විවාහ සම්බන්ධතා මගින් ප්‍රදේශ ඈඳා ගැනීමට කටයුතු කළේය.

චන්ද්‍රගුප්ත රජුගෙන් පසු කුමාරගුප්ත, ස්කන්ධ ගුප්ත, යන රජවරු පිළිවෙලින් බලයට පත් වූ අතර ස්කන්ධ ගුප්තගේ රාජ්‍ය කාලයෙන් පසු ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය සිදු විය. යසෝධර්මන් වැනි ප්‍රාදේශීය නායකයන්ගේ නැගී ඒමත් රජ පවුලේ වූ අරගලත් නිසා ගුප්ත අධිරාජ්‍යය පරිහානියට පත් වී ය.

ගුප්ත යුගයේ පාලන සංවිධානය, සමාජ තත්ත්වය, ආර්ථික තොරතුරු හා සංස්කෘතික කටයුතු පිළිබඳ සොයා බලමු.

## පාලන තන්ත්‍රය

- "මහාරාජාධිරාජ" යන විරුදය ගුප්ත රජවරු භාවිත කළ හ.
- පාලකයා මුලින් රජු ලෙසත් අධිරාජයා ලෙසත් පෙනී සිටි බව කියයි.
- මන්ත්‍රීවරු පරිපාලන සංවිධානයේ ඉහළ ම බලධාරීහු වූහ
- හමුදා නායකයෙක් වූ අතර මහා දණ්ඩනායකවරු හමුදංක භාර සේනාධිපතිවරු ද වූහ.
- මධ්‍ය පාලනය හා ප්‍රාදේශීය පාලනය සම්බන්ධ නිලධාරීවරු ලෙස කුමාරමාත්‍ය, ආයුක්ත යන අය වූහ. ආයුක්තයෝ නගර පාලනය හා භාණ්ඩාගාර පාලනයේ යෙදී සිටියහ.
- ප්‍රාදේශීය පාලන ඒකක "භුක්ති" නමින් හැඳින්වීය.
- අධිකරණ කටයුතු සඳහා රජු පෞද්ගලික ව සහභාගි විය. විනිශ්චයකාරවරු, අමාත්‍යවරු හා පුරෝහිතවරු රජුට සහාය වූහ.

## ආර්ථික තත්ත්වය

- ගංගා නිම්න ආශ්‍රිත ව කෘෂිකාර්මික කටයුතු කර ඇත.
- පුළුල් ලෙස ව්‍යාප්ත වූ කර්මාන්තය වූයේ රෙදිපිළි (සේද, කපු, ලෝම) කර්මාන්තයයි.
- ඇත්දත් කැටයම්, රන්, රිදී, තඹ, ලෝහ ආදියෙන් තැනූ ආභරණ භාවිත කර ඇත.
- කාර්මික, වෙළෙඳ, ශිල්ප ශ්‍රේණි මෙකල සංවිධානාත්මක ලෙස තිබිණ.

### සමාජ තත්ත්වය

- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන චතුර්වර්ණ දක්නට ලැබිණ.
- ගෝත්‍රය තුළ ම විවාහ සිදු විය.
- ගණිකා වෘත්තිය ද සමාජයේ පිළිගත් වෘත්තියක් ව පැවතුණි.

### ආගම හා දර්ශනය

- වර්තමාන හින්දු ආගම ද මෙකල සංවර්ධනය විය.
- විෂ්ණු සහ ශිව වන්දනය දක්ක ගත හැකි විය.
- "පුරාණ" නමින් හැඳින්වූ ග්‍රන්ථ ප්‍රධාන ආගමික සාහිත්‍යය බවට පත්විය.
- වෛෂ්ණව නිකායිකා අවතාර සිද්ධාන්තය පැතිරයාම මෙකල සිදු විය.
- ලක්ෂ්මී වන්දනය ජනප්‍රිය ආගමික විශ්වාසයක් පැවතුණි.
- ශක්ති දේවතා වන්දනය හා ගණපති වන්දනය ජනප්‍රිය ඇදහිලි විය.
- මහායාන බුදු දහමේ ව්‍යාප්තිය සිදුවිය.
- මේ යුගයේ ඩෙකෑනයේ ජෛන ඉගැන්වීම් ප්‍රබල ලෙස පැතිර ගියේ ය.



රූපය 2.4 - ශිව

### අධ්‍යාපනික තත්ත්වය

- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, යන වර්ණ තුනට පමණක් අධ්‍යාපනය ලැබීමේ අයිතිය හිමි විය.
- බ්‍රාහ්මණයන්ට පමණක් ඉගෙනීමේ හා ඉගැන්වීමේ අයිතිය ලැබිණ.
- බ්‍රාහ්මණ අධ්‍යාපනය ගුරු ගෙදර මුල් කර ගෙන සිදු විය.
- බෞද්ධ ආරාමික අධ්‍යාපනය පැවති බව පාලි අට්ඨකථාවල සඳහන් වේ.
- ලෝකයේ ඉමහත් කීර්තියක් ඉසිලූ බෞද්ධ උසස් අධ්‍යාපන ආයතන මෙම යුගයේ දියුණුවට පත්විය. (නාලන්ද, වලභි විශ්වවිද්‍යාල)
- පුළුල් විෂය මාලාවක් යටතේ අධ්‍යාපනය ලැබීමට හැකි විය.
- ව්‍යාකරණ නිවැරදි ව ඉගෙනීම අධ්‍යාපනයේ මූලික පදනම විය.
- සාමාන්‍ය ජනතාව සඳහා වූ අධ්‍යාපන ක්‍රමයක් ද ඉන්දියාවේ තිබිණ.



රූපය 2.5 - පාර්වතී

### සාහිත්‍යය

- සංස්කෘත සාහිත්‍ය දියුණු විය.
- පුරාණ ග්‍රන්ථ අනුගමනය කරමින් ලියූ උප පුරාණ ග්‍රන්ථ දහඅටක් විය.
- ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථ, රචනා වනු දැකිය හැකි ය.
- නවරත්න නමින් හඳුන්වන ලද පඬිවරුන් නව දෙනෙක් මෙකල විසූහ.
- විශ්ව සාහිත්‍යයේ ම අග්‍රගණ්‍ය කෘතියක් වූ සකුන්තලා කාව්‍ය මෙම යුගයේ ලියැවී ඇත.
- කාලිදසගේ මේඝ දූත කුමාර සම්භවය, රඝු වංශය, අනභිභවනීය කෘති ලෙස වැදගත් වී ය.
- නාට්‍ය, ඡන්දස්, අලංකාර. ජ්‍යෝතිර්වේදය, ගණිත. තර්ක ශාස්ත්‍රය ආදිය යටතේ ග්‍රන්ථ සිය ගණනක් රචනා කර ඇත.

### මූර්ති කලාව

- මථුරා සම්ප්‍රදය අනුව මූර්ති නිර්මාණය කිරීම (නිද : සාරානාත් බුද්ධ ප්‍රතිමාව)
- හින්දු දේව ප්‍රතිමා නෙළීම, ශිව, පාර්වතී ප්‍රතිමා

### ගෘහ නිර්මාණ ශිල්පය

- ආගමික ගොඩනැගිලි තැනීමේ සම්ප්‍රදය මෙකල දියුණු විය.
- ගඩොල් හා ගල්කණු යොදගෙන ගෘහ නිර්මාණය කෙරිණ.
- බෞද්ධ ආගමික ගෘහ නිර්මාණ ශිල්පයේ ප්‍රධාන අංග වූ ආරාම, විහාර හා චෛත්‍ය සෑදීම මෙම යුගයේ වර්ධනය විය. නිද : අජන්තා, එල්ලෝරා, වැනි ලෙන් විහාර නිමැවීම.
- අලංකාර කැටයම් තිබීම
  නිදා: අජන්තා ලෙන්වලට සැතපුම් 150ක් පමණ වයඹින් පිහිටි බාඝ්හි ලෙන් විහාරය
- බෞද්ධ ස්තූප හා ආරාම සංකීර්ණය ද (බුද්ධගයා, නාලන්ද) මේ වකවානුවේ දියුණු විය.

## චිත්‍ර කලාව



රූපය 2.6 - අජන්තා චිත්‍ර

- ✍ මෙම යුගයට අයත් වාත්ස්‍යායනගේ කාම සූත්‍රයෙහි චිත්‍ර කලාව ද සූසැට ශිල්පයන්ගෙන් එකක් ලෙස දක්වා ඇත.
- ✍ අජන්තා එල්ලෝරා චිත්‍ර ඉතා ප්‍රසිද්ධ ලෙන් චිත්‍ර වීම.

### සාරාංශය

- ✪ සින්දු නදිය ආශ්‍රිත පංජාබ් ප්‍රදේශයේ පළමුවෙන් ම ආර්ය ජනාවාස පිහිටුවා ගැනීම.
- ✪ ක්‍රි. පූ. 6වන සියවස වන විට දකුණු ඉන්දියාවට මෙන් ම ලංකාවට ද ආර්ය ජනාවාස ව්‍යාප්ත වීම
- ✪ වේද ග්‍රන්ථ, උපනිෂද්, පුරාණ ග්‍රන්ථ, මහා භාරතය මෙම යුගය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍රයන් ය.
- ✪ වෛදික යුගයේ රාජාණ්ඩු හා ගණ රාජ්‍ය තිබීම.
- ✪ සංචාරක එඬේර ජීවිත ගත කළ ආර්යයන් කෘෂිකර්මාන්තය, වෙළඳාම හා කර්මාන්ත කෙරෙහි නැඹුරු වීම .
- ✪ පීතෘ මූලික සමාජයක් වීම.
- ✪ මගධ, කෝසල, වත්ස, අවන්ති යන බලවත් ජනපද හතරක් සහිත ව මහා ජනපද දහසයක් ඇති වීම.
- ✪ ඉන් මගධය බලවත් රාජ්‍යයක් ලෙස නැගීම.
- ✪ නන්දයන් යටතේ මගධය බලවත් වීම.
- ✪ මෞර්ය අධිරාජ්‍ය ව්‍යාප්ත වීම.
- ✪ අශෝක අධිරාජයා මෞර්ය අධිරාජ්‍යයේ වැදගත් පාලකයෙකු වීම.
- ✪ ජනහිතකාමී පාලකයෙකු ලෙස ප්‍රසිද්ධ වීම.
- ✪ මෞර්ය යුගයේ විධිමත් පාලන සංවිධානයක් පැවතීම.
- ✪ සංස්කෘතික දියුණුවක් ඇතිවීම.
- ✪ බෞද්ධාගම මෙන් ම අනෙක් ආගම් සඳහා ද සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- ✪ පළමුවන චන්ද්‍රගුප්ත, සමුද්‍රගුප්ත, හා දෙවන චන්ද්‍රගුප්ත, යටතේ ගුප්ත අධිරාජ්‍යයේ නැගීම
- ✪ ගුප්ත යුගයේ සංස්කෘතික තත්ත්වය ඉතාමත් දියුණු මට්ටමක පැවතීම.

### අභ්‍යාස

1. ආර්ය ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රදේශ ඉන්දියාවේ සිතියමක ලකුණු කර නම් කරන්න.
2. සොළොස් මහා ජනපද නම් කරන්න.
3. අශෝක රජතුමාගෙන් සිදුවූ සේවා 5ක් සඳහන් කරන්න.
4. ගුප්ත යුගයේ පාලන සංවිධානයේ ප්‍රධාන නිලධාරීන් නම් කරන්න.
5. ගුප්ත යුගයේ සංස්කෘතික දියුණුව යටතේ පහත සඳහන් ක්ෂේත්‍රවලට නිදසුන් දක්වන්න.
   - ✪ සාහිත්‍යය
   - ✪ ගෘහ නිර්මාණ ශිල්ප
   - ✪ මූර්ති කලාව
   - ✪ චිත්‍ර කලාව

### වැඩිදුර කියවීමට

- ☞ ඉන්දීය ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ☞ අසිරිමත් ඉන්දියාව - ඒ.එල්.බෂාම්
- ☞ ලෝක ඉතිහාසය - බී. වී. රාවෝ